**සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ ගනුදෙනු පිළිබඳ** වාර්තාව **- 2023**

**-----------------------------------------------------------------------------------------------**

සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ 2023දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2) (ඇ) ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ කාර්යසාධන වාර්තාවක්ද සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020, 2021 ,2022 හා 2023 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.4 **2019 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් හා වගකීම්වල තත්ත්වය**

අරමුදල විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 33,198,564 |
| ජංගම වත්කම් | 134,519,860 |
| **මුළු වත්කම්** | **167,718,424** |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 144,867,690 |
| <u>වගකීම්</u> | |
| ජංගම බැරකම් | 22,850,734 |

| | |
|---|---|
| | --------------- |
| **මුළු බැරකම්** | **167,718,424** |
| | ========= |
| මුළු ආදායම | 13,336,957 |
| මුළු වියදම | 2,318,911 |
| | --------------- |
| **අතිරික්තය** | **11,018,046** |
| | ======= |

**2.** **විගණන නිරීක්ෂණ**

**2.1** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | **(i)**මුදල් රෙගුලාසි 381 **(i)** | අරමුදලේ ජංගම ගිණුම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේ දී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| | (ii ) මුදල් රෙගුලාසි **382** | 2023 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව 2017 ජනවාරි 30 සිට 2023 අගෝස්තු 08 දක්වා තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ වටිනාකම රු. 701,020 ක් වූ චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර මෙම චෙක්පත් 2024 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| | **(iii)**මුදල් රෙගුලාසි 383 | 2023 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එකතු වටිනාකම රු. 38,108,485 ක් වූ සෘජු ප්‍රේෂණ හඳුනාගෙන මුදල් පොතේ සටහන් කර ගිණුම්ගත කර නොතිබුණි. මෙම ප්‍රේෂණ තුළ 2016 ඔක්තෝබර් 05 සිට 2019 ජුනි 26 දක්වා ප්‍රාදේශිය කාර්යාල වලින් සෘජු ප්‍රේෂණ ලෙස තැන්පත් කල එකතු | දිස්ත්‍රික්කවල මුදල් තැන්පත් කර කුවිතාන්සි පිටපත එවීමේ ප්‍රමාදයක් පවතින බැවින් දිස්ත්‍රික් දැනුවත් කර ඇති අතර බැංකු මගින් අදාල චෙක්පත් තැන්පතු වලට විස්තර ලබාගෙන එම දිස්ත්‍රික්ක දැනුවත් කිරීමේ කටයුතු කරගෙන යනු ලබන අතර ඉදිරියේදී සෘජුවම චෙක්පත් මෙම අංශයට | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම රු. 928,675 ක් වූ චෙක්පත් 9 ක් පැවතුණි. | එවීමට දිස්ත්‍රික්ක දැනුවත් කර ඇති බව. | |
| (ආ) (ii) II කොටසේ 9 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල්වල භාරකාරිත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තබන බවට වගබලාගත යුතු වුවත් අරමුදලේ මුදල් හා තොග සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | මෙම අරමුදලේ ගිණුම් කටයුතු සම්බන්ධයෙන් පලමුවන අත්සන යොදනු ලබන නිළධාරියා විසින් ඇප තැන්පත් කර ඇති අතර දෙවන අත්සන යොදන සමෘද්ධි කළමණාකරුවන් දෙදෙනා හා ගබඩාභාරකරු විසින් ඉදිරියේ දී ඇප තැන්පත් කිරීමේ කටයුතු කරන බව. | චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය ප්‍රකාරව වටිනාකමින් අඩු සම්මත පිරවිතර ඇති වහාම ලබාගත හැකි භාණ්ඩ මිලදී ගැනිම සඳහා වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය තෝරාගත හැකි නමුත් 2023 වර්ෂය සඳහා මිලදීගත් රු. මිලියන 115.7ක් වූ ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනයන්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 ඡේදය ප්‍රකාරව පුවත්පත් දැන්වීම් පලකොට ජාතික වශයෙන් තරඟාකාරී ලංසු කැඳවීමට කටයුතු නොකිරිම තුළින් ප්‍රසම්පාදනයන්ට උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ඊට සහභාගීවිමට ඇති අවස්ථා අහිමිකර ඇති අතර උසස් ගුණාත්මක භාවයක් සහිතව අවම පිරිවැයක් යටතේ උපරිම ආර්ථික වාසි සලසා ගැනීමට නොහැකිවි තිබුණි. එසේම නියමිත නීතිරීති, පිරිවිතරවලට අනුකූලවන පරිදි හා ඇගයිමේ හා තේරීමේ කාර්ය පරිපාටිය විනිවිදභාවයකින් තොරව සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | 2024 වර්ෂයේ සිට විවෘත වෙළෙඳ පොළ මිල සැසඳුම් ක්‍රමය යටතේ මිල කැඳවීම සිදු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුයි. |

### 3.3 නොවිසඳුන විගණන ඡේද

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව මා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ 3.2 ඡේදය යටතේ ඇතුළත් වූ පහත සඳහන් විගණන නිරීක්ෂණ සම්බන්ධව නිසි පියවර ගෙන නොතිබුණි.

| | නොවිසඳුන විගණන ඡේද | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා සළුසල ආයතනයට අයත් ගබඩාවේ ගබඩා කර තිබූ ලිපිද්‍රව්‍ය තොග 2010 වර්ෂයේදී ඉවත් කර ගෙන තිබූ නමුත්, ඒ සඳහා ගෙවූ රු. 1,454,112 ක් වූ ගබඩා කුලී තැන්පතුව ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල පියවා ගැනීම සඳහා තවදුරටත් පරීක්ෂා කිරීම් සිදුකර මේ වන විට එම මුදල් පැවරුමක් ලෙස රඳවා ගෙන ඇති ආයතනය හඳුනා ගැනීමට පියවර ගෙන ඇති බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනිමට කටයුතු කල යුතුයි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරිම වෙනුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 21,269,895 ක් වර්ෂ 04 කට අධික කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අරමුදලෙහි අවසන් ගිණුම් අවසන් වරට පිළියෙල කර ඇත්තේ 2019 වර්ෂයේදීය. එබැවින් මෙම බැරකමට අදාළව මුදල් පොත්, ඉදිරිපත් කර ඇති ඉන්වොයිස් ඇතුළුව සියළු ගණුදෙනු පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1) ප්‍රකාරව වාර්ෂිකව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය එම අරමුදලේ අරමුණට අනුකූලව පිළියෙල කර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළයුතු අතර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව අනුමත කරන ලද අයවැයකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ බැංකු ලිපිද්‍රව්‍ය ලබාගැනීම සඳහා රු. 115,720,800 ක් වැය කර තිබුණි. | 2023 වසරේ ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර ඇත. ඒ අනුව අනුමත මුදල් සීමාව තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. 2023 වසරේ ලිපිද්‍රව්‍ය වියදම් මුදල රු. 80,266,000 ක් බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුයි. |